**හින්දු සංස්කෘතික අරමුදල - 2018**

---------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

හින්දු සංස්කෘතික අරමුදලේ 2018දෙසැම්බර් 31 දිනටශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍යකාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේඅභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලටට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණපහත සඳහන් පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රසම්පාදනයන් ආරම්භ කිරීමේදී ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු අපේක්ෂිත කාලයතුලදී ඉටුකර නොගැනීම. | එවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇතිවීම වැළැක්වීම සඳහා පියවර ගන්නා බව. | අපේක්ෂිත අරමුණු අපේක්ෂිත කාලය තුළදී ඉටුකිරීම සඳහා ප්‍රසම්පාදනයන් මනාව සැලසුම් කළ යුතුවීම. |
| (ආ) ඇතැම් වත්කම් ශේෂයන් ලෙජර් ගිණුම්වල දක්වා නොතිබීම. | එවැනි තත්ත්වයන් ඉරිදියේදී ඇතිවීම වැළැක්වීම සඳහා පියවර ගන්නා බව. . | සියලුම ගනුදෙනු හා සිද්ධීන් සඳහා උපයෝගි ලේඛන පදනම් කරගනිමින් ලෙජර ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිත අංක 7 හි 57 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කළ යුතු වුවත්, අරමුදල සතු උපකරණ ක්ෂය කර නොතිබුණි. | අනාගතයේ දී උපකරණ ක්ෂය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර වත්කම් ක්ෂය කළ යුතුවීම හා ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. |
| (ආ) ප්‍රමිත අංක 1 හි 118(අ) ඡේදය ප්‍රකාරව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි කාලපරිච්ඡේදයට අදාල අතිරික්තය හෝ ඌනතාවය දැක්විය යුතු | ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ 2018 වර්ෂයට අදාල අතිරික්තය රු. 1,107,624 ක් වැරදීමකින් දක්වා නොමැත. | ප්‍රමිතය ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතු වීම. |

වුවත්,අරමුදලේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,107,624 ක් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,107,624 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,586,304 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,478,680 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂවකොඩි දින එකතු කිරීම්(පඩුරු මුදල්) ව්‍යාපෘතියේ ආදායම රු.5,558,338 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

-------------------------------------------------------------

| විෂයය | 2018<br>රු.000 | 2017<br>රු.000 | ආදායම(අඩුවීම)/වැඩිවීම<br>වියදම් (වැඩිවීම)/අඩුවීම<br>රු.000 | සියයට |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| පසුරු මුදල් ආදායම | 2,246 | 7,804 | (5,558) | (71.2) |
| පරිත්‍යාග | 3,796 | 1,251 | 2,545 | 203.4 |
| පොත් අලෙවි ආදායම | 212 | 419 | (207) | (49.4) |
| ටිකට්පත් අලෙවි ආදායම | - | 2,044 | (2,044) | (100) |
| **වියදම්** | | | | |
| ගුරුවරුන් සඳහා සාරි මිලදී ගැනීම | 1,150 | 2,200 | 1,050 | 47.7 |
| කෝවිල් සඳහා මූල්‍ය සහාය | 2,000 | 300 | (1,700) | (566.7) |
| කොඩි දින වියදම් | 203 | 394 | 191 | 48.5 |
| උපකාරක පොත් මුද්‍රණය කිරීම | 2,083 | 1,684 | (399) | (23.8) |

| | | | | |
|---|---|---|---|---|
| අභ්‍යාස පොත් මිලදී ගැනීම | 919 | - | (919) | (100) |
| බයිසිකල් මිලදී ගැනීම | 247 | 785 | 538 | 68.5 |
| සම්මාන ප්‍රදානය | 2,001 | 1,045 | (956) | 91.5 |
| සංගීත වැඩසටහනෙහි වියදම් | - | 1,441 | 1,441 | 100 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** හින්දු ආගමික පොත් හා අරනෙරි පාසල් ළමුන් සඳහා උපකාරක පොත් මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනරු.991,143 ක් වැයකර තිබූ අතර, ඉන් 2019 ජුනි 18 දින වන විටත් රු.380,413ක් වටිනා පොත් අරමුදල වෙත ලැබී නොතිබුණි. | දැනට එම පොත් මුද්‍රණ කටයුතු අවසන් කර දෙපාර්තමේන්තුවටලැබී ඇත. මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මනාව සැලසුම් කළ යුතුවීම. |
| **(ආ)**අරනෙරි පාසල්ගුරුවරුන් සඳහා නිල ඇඳුම් රෙදිමිලදී ගැනීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ දී සිදුකිරීමට සැලැසුම් කළද, සාරි 1,000 ක් මිලදී ගැනීම සඳහා රු.1,150,000 ක් ගෙවීම් කර තිබුණේ දෙසැම්බර් මාසයේදීය. එසේ වුවද, 2019 මැයි 30 දින වනවිටත් ලැබී තිබුණේ සාරි 400 ක් පමණි. මිලදී ගැනීමේ කටයුතු වර්ෂය අවසානයේ දී | දැනට ලබා දී ඇති නිල ඇඳුම් බෙදාහැරීමේ කටයුතු සිදු කර ඇත. මෙම මාසය ඇතුලත ඉතිරි නිල ඇඳුම් ලබාගෙන බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලබන අතර මෙවැනි තත්ත්වයක් ඉදිරියේ දී වැළැක්වීම සඳහා පියවර ගනු ඇත. | අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මනාව සැලසුම් කළ යුතුවීම. |

ආරම්භ කිරීම හේතුවෙන් 2019 මැයි වනවිටත් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.